ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 අප්‍රේල් මස 6 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 ජනවාරි

**සමස්ත නිරීක්ෂණ**

2018 ජනවාරි මාසයේදී වෙළඳ හිඟය පුළුල් වීම හමුවේ වුවද, මූල්‍ය ගිණුමේ ලැබීම් ඉහළ යෑමත් සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ වර්ධනයක් පිළිබිඹු විය. මාසය තුළදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම ඉහළ ගියද අපනයන ආදායමේ ඉහළ යෑමට වඩා වැඩියෙන් ආනයන වියදම ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, පසුගිය වසරේ පැවති මධ්‍යස්ථ ප්‍රවණතාවයෙහි වෙනසක් ඇති කරමින් 2018 වසරේ ජනවාරි මාසයේදී සංචාරක ඉපැයීම් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. 2017 වසරේදී අඩු වීමක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ ජනවාරි මාසයේදී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ හා කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන හේතුවෙන් 2018 වසරේ ජනවාරි මාසයේදී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත අඛණ්ඩව ඉහළ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. 2018 වසරේ ජනවාරි මස අවසානය වන විට රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.3 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.7 ක් විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වර්ධනයන් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2018 වසරේ ජනවාරි මාසයේදී සියයට 0.6 කින් සහ 2018 වසරේ අප්‍රේල් මස 05 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී සියයට 2.0 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 එ.ජ. ඩොලර් මිලියන | 17/16 වෙනස (%) | 2017 ජනවාරි එ.ජ. ඩොලර් මිලියන | 2018 ජනවාරි එ.ජ. ඩොලර් මිලියන | 18 ජන./ 17 ජන. වෙනස (%) |
|---|---|---|---|---|---|
| අපනයන | 11,360 | 10.2 | 865 | 965 | 11.6 |
| ආනයන | 20,980 | 9.4 | 1,799 | 2,014 | 12.0 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -9,619 | | -934 | -1,049 | |
| සංචාරක ඉපැයීම් | 3,925 (ආ) | 11.6 | 407 (ආ) | 443 (ඇ) | 8.9 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 7,164 (ඈ) (ඉ) | -1.1 | 670 (ඈ) (ඉ) | 729 | 8.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඊ) | 279 | | -11 | 37 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් | 5,702 | | 217 | 286 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 1,667 | | 83 | 170 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 1,500 | | - | - | |
| දිගුකාලීන ණය | 1,535 | | 134 | 116 | |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | 1,000 | | - | - | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම | 419 | | - | - | |
| විදේශීය සෘජු ආයෝජන (උ) | 1,913 | | | | |
| සමස්ත ශේෂය | 2,068 | | -212 | -6 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැක.

(ඈ) සංශෝධිත

(ඉ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සංශෝධිත දත්ත මත පදනම් වේ.


(ඊ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(උ) දත්ත පවතිනුයේ 2017 වසර සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය

අපනයන ආදායම ඉහළ යෑමේ වාසිය මගහරවමින්, ආනයන වියදමෙහි වූ කැපී පෙනෙන ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ ජනවාරි මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය අඛණ්ඩව දෙවැනි මාසයටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය.

**රූප සටහන 1 : මාසික වෙළඳ ශේෂය**





**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

2017 ජනවාරි මාසයේදී අපනයන ආදායම සියයට 3.8 කින් පහළ යෑම තුළින් ඇති වූ පදනම් බලපෑම ද හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව අංක දෙකක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 965 ක් දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා ආහාර, පාන වර්ග හා දුම්කොළ, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ තේ අපනයන ආදායම් ඉහළ යෑම විශාල වශයෙන් දායක විය. ධාන්‍ය සැකසුම් හැර ආහාර, පාන වර්ග හා දුම්කොළ යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම කාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. නැව් සඳහා භාවිතා කරන ඉන්ධනවල අපනයන පරිමාව සියයට 72.1 කින් වර්ධනය වීමත්, අපනයන මිල ගණන් ඉහළ යෑමත් හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තවද, රබර් නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල අපනයන විශේෂයෙන්ම රබර් ටයර් අපනයන ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, කැනඩාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, චීනය, සෞදි අරාබිය සහ ජපානය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන පහළ ගියද, යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම පිළිවෙළින් සියයට 4.9 කින් හා සියයට 1.7 කින් ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන

**රූප සටහන 2: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ආදායම මධ්‍යස්ථ ලෙස ඉහළ ගියේය. මේ අතර, අපනයන මිල ගණන් හා අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම ඉහළ ගියේය. තවද, කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, මූල ලෝහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් මෙන්ම කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, අපනයන ආදායම ඉහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, නියඟය හේතුවෙන් දේශීය පොල් නිෂ්පාදනය පහළ යෑම නිසා 2018 ජනවාරි මාසයේදී දිසිදි පොල්, පොල් තෙල් හා කොප්පරා වැනි පොල් මද ආශ්‍රිත අපනයන පරිමාවන් අඩු වීමෙන් පොල් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහළ ගියේය. මීට අමතරව, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, රබර් සහ කුළුබඩු අපනයන ආදායම ද මෙම මාසය තුළදී පහළ ගියේය. 2018 ජනවාරි මාසයේදී ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ වූ අතර එම රටවලට සිදු කළ අපනයනවලින් ලද ආදායම මුළු අපනයන ආදායමෙන් සියයට 51 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**


| කාණ්ඩය | 2017 ජන.-දෙසැ. (එ.ජ.ඩොලර් මිලියන) | 17/16 වෙනස (%) | 2017 ජනවාරි (එ.ජ.ඩොලර් මිලියන) | 2018 ජනවාරි (එ.ජ.ඩොලර් මිලියන) | 18 ජන./ 17 ජන. වෙනස (%) |
|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **8,541.9** | **7.6** | **668.0** | **757.6** | **13.4** |
| ආහාර හා පාන වර්ග | 392.7 | 21.3 | 22.1 | 48.2 | 118.3 |
| සත්ත්ව ආහාර | 80.2 | 18.2 | 6.9 | 7.1 | 3.0 |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,031.9 | 3.0 | 426.3 | 434.8 | 2.0 |
| එයින් ඇඟලුම් | 4,739.3 | 3.0 | 405.2 | 409.3 | 1.0 |
| රෙදිපිළි | 205.4 | 2.6 | 14.7 | 18.5 | 25.9 |
| වෙනත් රෙදිපිළි ඇඟලුම් | 87.3 | 7.6 | 6.4 | 7.0 | 8.4 |
| රබර් නිෂ්පාදිත | 835.4 | 8.8 | 58.0 | 71.0 | 22.6 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 257.5 | (6.0) | 21.8 | 27.5 | 26.4 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 370.8 | 16.7 | 26.0 | 29.7 | 14.4 |
| ප්‍රවාහන උපකරණ | 162.3 | 23.4 | 7.3 | 7.4 | 1.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 434.3 | 51.4 | 29.5 | 52.7 | 78.8 |
| රසායනික නිෂ්පාදිත | 146.4 | 16.0 | 11.0 | 12.5 | 14.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 138.8 | 19.0 | 11.2 | 11.3 | 0.7 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 48.8 | 15.3 | 4.6 | 1.5 | (67.5) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 158.4 | (4.4) | 9.3 | 13.0 | 39.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 74.6 | 12.5 | 4.7 | 6.2 | 33.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 115.9 | 29.3 | 8.2 | 12.1 | 48.7 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 33.7 | (1.9) | 2.1 | 2.0 | (6.2) |
| වෙනත් කාර්මික අපනයන | 260.2 | 6.0 | 19.2 | 20.5 | 6.7 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **2,767.2** | **19.0** | **193.7** | **204.1** | **5.4** |
| තේ | 1,529.8 | 20.5 | 101.6 | 111.8 | 10.1 |
| රබර් | 38.9 | 19.1 | 5.0 | 4.1 | (19.2) |
| පොල් | 347.9 | (4.9) | 27.3 | 21.1 | (22.5) |
| කුළුබඩු | 406.2 | 28.1 | 30.4 | 30.0 | (1.3) |
| එළවළු | 28.5 | 7.5 | 1.8 | 1.9 | 3.3 |
| සකස් නොකළ දුම්කොළ | 36.5 | 17.1 | 2.0 | 1.8 | (13.7) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 138.7 | 21.6 | 7.3 | 10.5 | 44.4 |
| මුහුදු ආහාර | 240.6 | 41.9 | 18.2 | 22.9 | 25.8 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **51.4** | **18.0** | **3.0** | **3.6** | **19.3** |
| **මුළු අපනයන** | **11,360.4** | **10.2** | **864.7** | **965.4** | **11.6** |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

**වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය**

**රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන සඳහා වූ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී ආනයන වියදම අඛණ්ඩව දෙවැනි මාසයටත් එ.ජ. ඩොලර් බිලියන 2 ඉක්මවීය. පිරිපහදු කළ බනිජ තෙල් ආනයන පරිමාව අඩු වුවද, බොරතෙල් ආනයන පරිමාව ඉහළ යෑම සහ සියලුම ඉන්ධන කාණ්ඩවල ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. බොරතෙල් බැරලයක් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල 2017 ජනවාරි මාසයේදී වූ එ.ජ. ඩොලර් 57.39 ට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේදී එ.ජ. ඩොලර් 72.04 ක් දක්වා ඉහළ ගියේය. තවද, පොහොර, විශේෂයෙන්ම යූරියා සඳහා වූ සාමාන්‍ය ආනයන මිල හා පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී පොහොර ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2018 ජනවාරි මාසයේදී රත්‍රං ආනයන වියදම අඛණ්ඩව කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මීට අමතරව, 2018 වසර සඳහා වූ අයවැය මගින් විද්‍යුත් මෝටර් රථ ආනයන සඳහා පනවා තිබූ තීරුබදු පහළ දැමීම හේතුවෙන් පෞද්ගලික රථවාහන, විශේෂයෙන්ම විද්‍යුත් මෝටර් රථ සඳහා වූ ආනයන වියදම ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන්ම යකඩ හා වානේ ආනයන ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය. සහල් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් පහළ ගියද, සහල් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී සහල් ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, මෙම මාසය තුළ කිරි නිෂ්පාදිත, කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත උපාංග, ප්‍රවාහන උපකරණ, රෙදිපිළි හා උපාංග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්ම ඉංජිනේරු උපකරණ, විදුලි සංදේශ මෙවලම් සහ බෙහෙත් හා රසායනාගාර උපකරණ ආනයනය පහළ යෑම හේතුවෙන් 2018 ජනවාරි මාසයේදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහළ ගියේය. එසේම, රෙදිපිළි ආනයනය පහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහළ ගියේය. 2018 ජනවාරි මාසයේදී කෘෂිකාර්මික යෙදවුම්, කුළුබඩු සහ රබර් නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය. 2018 ජනවාරි මාසයේ දී ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ සිංගප්පූරුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවති අතර එම රටවල් වෙතින් සිදු කළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 58 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 3: ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 ජන.-දෙසැ. (එ.ජ.ඩොලර් මිලියන) | 17/16 වෙනස (%) | 2017 ජනවාරි (එ.ජ.ඩොලර් මිලියන) | 2018 ජනවාරි (එ.ජ.ඩොලර් මිලියන) | 18 ජන./ 17 ජන. වෙනස (%) |
|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **4,502.5** | **4.3** | **358.8** | **441.5** | **23.0** |
| ආහාර හා පාන වර්ග | 1,841.1 | 13.1 | 143.6 | 183.7 | 27.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 314.5 | 1,320.2 | 12.7 | 33.2 | 160.9 |
| එයින් සහල් | 300.9 | 2,244.7 | 11.7 | 31.3 | 167.4 |
| කිරි නිෂ්පාදිත | 315.8 | 26.7 | 21.1 | 31.9 | 51.4 |
| සීනි හා රසකැවිලි | 258.0 | (25.1) | 22.0 | 27.6 | 25.5 |
| මුහුදු ආහාර | 217.5 | (8.3) | 18.2 | 20.6 | 13.4 |
| කුළුබඩු | 92.8 | (29.7) | 9.5 | 7.5 | (20.3) |
| පාන වර්ග | 81.5 | (16.8) | 6.0 | 4.8 | (20.1) |
| තෙල් සහ මේද | 46.0 | 28.1 | 4.3 | 4.7 | 10.7 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 514.9 | 1.3 | 49.9 | 53.3 | 6.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 2,661.5 | (1.1) | 215.2 | 257.8 | 19.8 |
| රථවාහන | 772.7 | (2.8) | 66.0 | 95.0 | 44.1 |
| රෙදිපිළි හා උපාංග | 369.0 | 0.9 | 30.1 | 37.5 | 24.6 |
| ගෘහ උපකරණ හා ගෘහ භාණ්ඩ | 186.2 | 2.2 | 13.7 | 15.8 | 15.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 520.0 | (1.1) | 38.9 | 44.1 | 13.4 |
| විදුලි සංදේශ උපකරණ | 281.2 | 13.8 | 22.1 | 24.4 | 10.4 |
| ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය | 77.4 | (10.8) | 7.4 | 6.8 | (8.8) |
| රබර් නිෂ්පාදිත | 94.3 | (15.8) | 9.7 | 7.8 | (19.6) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 360.8 | (4.4) | 27.3 | 26.4 | (3.3) |
| **2. අන්තර් භාණ්ඩ** | **11,435.8** | **15.9** | **950.6** | **1,133.3** | **19.2** |
| ඉන්ධන | 3,427.9 | 38.2 | 282.8 | 362.0 | 28.0 |
| එයින් බොරතෙල් | 704.0 | 18.1 | 42.0 | 103.4 | 146.6 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 2,462.5 | 45.9 | 204.7 | 223.9 | 9.4 |
| ගල්අඟුරු | 261.5 | 32.9 | 36.1 | 34.7 | (3.8) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 772.4 | 50.1 | 69.0 | 104.7 | 51.8 |
| එයින් රත්‍රං | 649.8 | 73.7 | 64.1 | 93.7 | 46.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,724.2 | 0.7 | 253.0 | 245.2 | (3.1) |
| මූල ලෝහ | 628.7 | 37.8 | 38.4 | 59.6 | 55.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 632.6 | 2.4 | 49.7 | 54.7 | 10.1 |
| කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 484.6 | (0.5) | 34.1 | 43.1 | 26.7 |
| පොහොර | 102.8 | (24.9) | 4.2 | 42.4 | 918.9 |
| ඛනිජ නිෂ්පාදිත | 211.1 | (4.9) | 15.1 | 13.7 | (9.3) |
| කෘෂිකාර්මික යෙදවුම් | 204.3 | 16.6 | 15.6 | 12.9 | (17.1) |
| සකස් නොකළ දුම්කොළ | 67.7 | 0.1 | 3.4 | 2.2 | (35.3) |
| වෙනත් අන්තර් භාණ්ඩ | 2,179.4 | 8.6 | 185.6 | 192.7 | 3.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **4,894.7** | **(1.7)** | **432.2** | **436.9** | **1.1** |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 2,620.6 | (4.4) | 250.6 | 240.3 | (4.1) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,591.4 | 1.4 | 136.0 | 143.1 | 5.3 |
| ප්‍රවාහන උපකරණ | 674.9 | 1.8 | 44.3 | 52.7 | 19.1 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 7.8 | (7.8) | 1.4 | 0.7 | (51.7) |
| **4. වර්ග නොකළ ආනයන** | **146.8** | **1,024.6** | **57.3** | **2.9** | **(95.0)** |
| **මුළු ආනයන** | **20,979.8** | **9.4** | **1,798.9** | **2,014.5** | **12.0** |


**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


මසකදී පැමිණි දෙවැනි වැඩිම සංචාරකයින් ප්‍රමාණය වාර්තා කරමින්, 2018 වසරේ ජනවාරි මාසයේදී සංචාරක පැමිණීම් සියයට 8.9 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, 2017 වසරේ දෙසැම්බර් වාර්තා වූ මාසයක් තුළ ඉහළම සංචාරක පැමිණීම් සංඛ්‍යාව වන 244,536 හා සැසඳීමේදී 2018 වසරේ ජනවාරි මාසයේදී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 238,924 ක් විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් 2018 වසරේ ජනවාරි මාසය තුළ සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේදී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 47.2 ක් විය. සංචාරකයින් පැමිණීමේ ප්‍රවණතාවට අනුව සංචාරක ඉපැයීම් ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2018 ජනවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 443 ක් දක්වා වර්ධනය විය.[1] මේ අතර, 2018 වසරේ ජනවාරි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2017 වසරේ ජනවාරි මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 670 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 729 දක්වා සියයට 8.8 කින් වර්ධනය විය.

**රූප සටහන 4: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

### මූල්‍ය ලැබීම්

රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2017 වසරේ ජනවාරි මස වාර්තා වූ ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේදී අඛණ්ඩව එකොළොස් වැනි මාසයට ද ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජනද 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2018 වසරේ ජනවාරි මාසයේ දී ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. තවද, රජය වෙත වූ දිගුකාලීන ණය මෙම මාසය තුළදී එ.ජ. ඩොලර් මිලියන 2.5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන 2017


[1] ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,913 ක් වූ අතර, එය මෙතෙක් ශ්‍රී ලංකාව වාර්තා කළ ඉහළම විදේශීය සෘජු ආයෝජන ලැබීම විය.

**ජාත්‍යන්තර සංචිත**

රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය 2017 වසර අවසානයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 8.0 සිට 2018 වසරේ ජනවාරි මාසය අවසානය වන විට ආනයනික මාස 4.3 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.7 දක්වා පහළ ගිය අතර, මාසය තුළදී ආසියානු නිෂ්කාශන සංගමය වෙත ගෙවීමට නියමිත වාරික ගෙවීම් මේ සඳහා මූලිකවම හේතු විය. 2018 වසරේ ජනවාරි මාසය අවසාන වන විට, බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2017 වසර අවසානයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 10.4 සිට එ.ජ. ඩොලර් බිලියන 10.0 (ආනයනික මාස 5.7 කට ප්‍රමාණවත් වන පරිදි) දක්වා අඩු විය.

**රූප සටහන 6: දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**




**මූලය :** ශ්‍රී ලංකා මහ බැංකුව

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

2018 අප්‍රේල් 5 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.0 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල වෙනත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය.

## රූප සටහන 7 :
## එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය




**මූලය :** ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 4 :
## අනෙකුත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම

| මුදල් ඒකකය | 2017 | 2018 අප්‍රේල් 05 දක්වා අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලර් | -2.0% | -2.0% |
| යූරෝ | -13.5% | -4.8% |
| ස්ටර්ලින් පවුම් | -10.5% | -6.4% |
| ජපන් යෙන් | -5.1% | -7.1% |
| කැනේඩියානු ඩොලර් | -8.6% | -0.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | -9.0% | -1.0% |
| ඉන්දියානු රුපියල් | -7.5% | -0.6% |

**මූලය :** ශ්‍රී ලංකා මහ බැංකුව